## අවසාන වාර පරීක්ෂණය - 2023
## ව්‍යාපාර අධ්‍යයනය - I කොටස
## 13 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

| | | |
|---|---|---|
| (1). 2 | (11). 3 | (21). 2 |
| (2). 3 | (12). 1 | (22). 5 |
| (3). 5 | (13). 4 | (23). 2 |
| (4). 2 | (14). 3 | (24). 3 |
| (5). 5 | (15). 5 | (25). 1 |
| (6). 4 | (16). 3 | (26). 2 |
| (7). 4 | (17). 2 | (27). 5 |
| (8). 1 | (18). 5 | (28). 2 |
| (9). 1 | (19). 1 | (29). 5 |
| (10). 2 | (20). 4 | (30). 3 |

(31). අ. අභ්‍යන්තර , ආසන්න ආ. අවශ්‍යතා , මානව

(32). අ. භාණ්ඩාගාර බිල්පත් , භාණ්ඩාගාර බැඳුම්කර ආ. අවශ්‍යතා , මානව

(33).
- i. අසත්‍යයි
- ii. සත්‍යයි
- iii. සත්‍යයි
- iv. අසත්‍යයි

(34). අ. ජාල මුදල් , ගම්‍ය මුදල් ආ. රක්‍ෂණ ඔප්පුව , අවදානම

(35). අ. ජන සන්නිවේදනය , සන්නිවේදනය ආ. ධාරිතාව , පිරිවැය

(36). ගතික , සංවිධානයක , සඵලදායි , කාර්යක්‍ෂමක

(37). අ. අඛණ්ඩ තොග වාර්තා කිරීමේ , පරිගණකගත තොග පාලන
ආ. ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) , තත්ත්ව කව

(38). අ. තෘප්තිය , වටිනාකම ආ. දවටනයක් , නිර්මානය කිරීමේ

(39). අ. ප්‍රාග්ධන තෝලනය , අධි තෝලනය
ආ. අයදුම්කරුවන් තෝරාගැනීම , සම්මුඛ පරීක්‍ෂණ

(40). අ. සංචේතන කළමනාකරණය , දිරි දීමනා ආ. හස්ත ක්‍රමය , විද්‍යුත්

(41).
- i. ගෘහ කර්මානත වෙනුවට කම්හල් කර්මාන්ත බිහිවීම
- ii. අත්යන්ත්‍ර භාවිතය වෙනුවට බලවේග යන්ත්‍ර භාවිතය
- iii. ස්වයං පරිභෝජනය වෙනුවට වෙළඳපොළ සඳහා නිෂ්පාදනය කිරීම
- iv. යන්ත්‍රෝපකරණ භාවිතය නිසා මහා පරිමාණ නිෂ්පාදනයට මග පෑදීම
- v. ශ්‍රම විභජනය හා විශේෂිකරණය යන ශිල්ප ක්‍රම නිෂ්පාදනයට යොදාගැනීම

(42).
- i. ආදායම් ඉපැයීම
- ii. ආදායම් විෂමතාවය අඩු කිරීම
- iii. සම්පත් බෙදාහැරීමේ දිශාව වෙනස් කිරීම
- iv. ආර්ථික ස්ථායිකරණය ඇති කිරීම
- v. දේශීය කර්මාන්ත ආරක්‍ෂා කිරීම
- vi. ඇතැම් භාණ්ඩ පරිභෝජනය අධෛර්මත් කිරීම

(43).
- i. ලියාපදිංචි ගාස්තු මගින් විදේශ විනිමය ගලා ඒම
- ii. ශ්‍රී ලංකාවෙන් ලබාගන්නා ස්ථාවර වත්කම් සඳහා බදු කුලී ලබා ගැනීම
- iii. ශ්‍රී ලංකාවෙන් විවිධ සේවා ලබා ගැනීම
- iv. ශ්‍රී ලාංකිකයන්ට දෙස් විදෙස් රැකියා ලැබීම
- v. ශ්‍රී ලාංකික ව්‍යාපාරික කීර්තිනාමය විදෙස් රටවල පැතිරීම

(44).
- i. රක්‍ෂණ සමාගම්
- ii. සේවක අර්ථ සාධක අරමුදල (EPF)
- iii. සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල (ETF)
- iv. අනුමත විශ්‍රාම හා අර්ථ සාධක අරමුදල්
- v. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල

(45).

i. භාණ්ඩ භෞතිකව පරීක්ෂා කළ නොහැකිවීම
ii. නියමිත භාණ්ඩය ම ලැබේදැයි නිශ්චිත නොවීම
iii. පරිගණක පද්ධති ආශ්‍රිතව වංචා හා දූෂණ සිදුවීම
iv. අන්තර්ජාල පහසුකම් සෑම ප්‍රදේශයකම ව්‍යාප්ත නොවීම
v. භාවිතය පිළිබඳ පාරිභෝගිකයන්ගේ දැනුම ප්‍රමාණවත් නොවීම
vi. අදාළ විද්‍යුත් උපකරණවල පිරිවැය අධිකවීම
vii. ගෙවීම් ක්‍රමවල පවතින ගැටලු

(46). ප්‍රියජනක බව , උසස් පෞරුෂත්ව ලක්ෂණ , බුද්ධිමත් බව , ආත්ම විශ්වාසය , කායික හා මානසික නිරෝගී බව, ස්වයං විනය , අධිෂ්ඨානය , කැපවීම

(47). පරිගණක ආධාරක නිර්මාණ ක්‍රමය / මෝස්තර ක්‍රමය
පරිගණක ආධාරක නිෂ්පාදන ක්‍රමය CAM
පරිගණක සමෝධානික නිෂ්පාදන ක්‍රමය CIM
පරිගණක අංකික පාලනය CNC

(48). පාරිභෝගික අවශ්‍යතා හා උවමනා , පිරිවැය , පහසුව , සන්නිවේදනය

(49). ලාභාංශ , පොළී , සංචිත ප්‍රාග්ධනීකරණය , හිමිකම් නිකුතුව , ප්‍රාග්ධන ලාභ

(50). උසස් කිරීම් , මාරු කිරීම් , තාවකාලීම , සේවයා අවසන් කිරීම

# ව්‍යාපාර අධ්‍යයනය

## II කොටස

### පිළිතුරු

(1).

i. අ. අවශ්‍යතා - ආහාරපාන ල. 01
වුවමනා - බත් , කොත්තු , කෙටි ආහාර , උපන්දින කේක් , උත්සව සඳහා කේක් ල. 01
ආ. තෘතියීක අංශය ල. 02

ii. අ. අලෙවිය වර්ධනය
ලාභය වර්ධනය
ආ. ගුණාත්මක භාණ්ඩ සැපයීම
සාධාරණ මිලකට භාණ්ඩ ලබාදීම ල. 02

iii. අ. අයිතිකරු කළමනාකරු සේවකයන්
ගනුදෙනුකරුවන් රජය ප්‍රජාව ල. $4 \times \frac{1}{2}$ = 02
ආ. දුප්පත් ජනතාවට වියළි ආහාර මලු ලබාදීම
පාසැල් සිසුන් සඳහා නොමිලේ කොළකැඳ ලබාදීම ල. 02

iv. අ. අයිතිකරුගේ පළපුරුද්ද
පුහුණු සේවකයන් සිටීම ල. 02
ආ. සේවා නියුක්තියට දායකවීම
බදු ගෙවීම
සමාජ වගකීම් ඉටු කිරීම
භාණ්ඩ හා සේවා නිෂ්පාදනය
ආර්ථික වර්ධනයට දායකවීම
ව්‍යාපාර කෙරෙහි උනන්දුව දක්වන පාර්ශවයන්ට විවිධ ප්‍රතිලාභ අත් කරදීම ල. $4 \times \frac{1}{2}$ = 02

**v.** **වාසි**
වෙළෙඳ පොළ පුළුල් වීම
පිරිවැය අවමවීම
වෙළඳපොළට පහසුවෙන් ඇතුල්විය හැකිවීම
අඩු සේවක සංඛ්‍යාවක් අවශ්‍යවීම
කාලය ඉතිරිවීම
දවසේ ඕනෑ ම වේලාවක ගනුදෙනු කළ හැකිවීම
පොදු කාර්ය පිරිවැය අවම වීම ල. $4 \times \frac{1}{2}$ = 02

**අවාසි**
වෙබ් පිටු නිර්මාණය සඳහා පිරිවැය වැය වීම
පාරිභෝගික විශ්වාසය අඩුවීම
නෛතික ගැටලු ඇතිවීම
ආරක්ෂාව පිළිබඳ ගැටලු
ගෙවීම් ක්‍රමවල ගැටලු ඇතිවීම
තාක්ෂණික බිඳ වැටීම් ල. $4 \times \frac{1}{2}$ = 02

(2).

i. අ.

- භාණ්ඩ හා සේවා බදු පැනවීම නිසා භාණ්ඩවල මිල ඉහළ යාමෙන් ඉල්ලුම අඩුවී විකුණුම් අඩු වී ලාභය අඩුවීම
- යෙදවුම්වල මිල ඉහළයාම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම
- ව්‍යාපාරවලින් (සමාගම්වලින්) අයකරන ඍජු බද්ද හේතුවෙන් ව්‍යාපාරයේ ලාභය අඩුවන අතර ප්‍රති ආයෝජන පහළ යෑම හා ව්‍යාපාර කටයුතු අධෛර්යමත් වීම
- වැනි වක්‍ර බදු පිළිබඳ ගනුදෙනු පියවීම හා ලහා ගැනීමේ කටයුතු ව්‍යාපාරිකයන් කළ යුතු නිසා ඔවුන්ට අතිරේක වියදමක් හා කාලයක් වැයවීම
- රටතුළ උද්ධමනයක් නිර්මාණය වීම හේතුවෙන් වැඩි වැටුප් ඉල්ලා සේවකයින් උද්ඝෝෂණය කළ හැකි අතර වැටුප් වැඩි කිරීමෙන් පිරිවැය ඉහළ යාම හා ලාභය අඩුවීම හෝ අලාභ සිදුවීම
- ආනයනික භාණ්ඩ සඳහා බදු පැනවීමෙන් ආනයන සීමා වී දේශීය ව්‍යාපාර ආරක්ෂා කරගත හැකි වීම

ල. $4 \times \frac{1}{2}$ = 02

ආ.

- ගුණත්වයෙන් යුත් උසස් භාණ්ඩ සාධාරණ මිලට සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය තහවුරු වීම
- ව්‍යාපාරිකයාගේ පිරිවැටුම ඉහළ යාම නිසා ලාභය ද ඉහළ යාම
- පළමිතියකට අනුව නිෂ්පාදනය කිරීම නිසා අඩුවීම
- අයහපත් තරග විරෝධි ක්‍රියා නොමැති වීමෙන් යහපත් ව්‍යාපාර පරිසරයක් ඇතිවීම
- පාරිභෝගික පැමිණිලි හා නීතිමය වීමෙන් යහපත් ව්‍යාපාර පරිසරයක් ඇතිවීම
- පාරිභෝගික සබඳතා තරවීම මගින් ලබන වාසි

(ල. $4 \times \frac{1}{2}$ = 02)

ii. අ.

- ගෙවන මුදලට සරිලන වටිනාකමකින් යුත් භාණ්ඩ තෝරාගැනීම
- ප්‍රමිතියෙන් ඉහළ භාණ්ඩ තෝරාගැනීම
- වෙළඳ විෂමාචාර වලට එරෙහිව ක්‍රියාකිරීම
- පාරිභෝගික අයිතිවාසිකම් කඩවීම පිළබඳව අදාළ බලධාරීන් දැනුවත් කිරීම
- තමා ජීවත්වන පරිසරය ආරක්ෂා කිරීම
- සමාජය පිළිබඳ සැලකිලිමත් වීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- සක්‍රිය දායකත්වය

(ල. $4 \times \frac{1}{2}$ = 02)

ආ. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් දේශීය අවශ්‍යතාවයන් අනුකූලවන පරිදි නියම කරන ලදුව රජය විසින් අනුමත කර ඇති යම් නිෂ්පාදිතයක තිබිය යුතු යැයි නියම කර ඇති ද්‍රව්‍ය බර, දිග, පළල, උස සනකම සන්නම යනාදිය (සම්පූර්ණ නිර්වචනයට ල. 02)

iii. අ.

- 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම අඥා පනත / පළාත් සභා ව්‍යාපාර නාම ප්‍රඥප්තිය
- විශේෂ බලපත්‍ර ලබාගැනීමේ අවශ්‍යතාවය උදා : මුද්‍රනාල , ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
- ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී බලපාන අතුරු නීති රීති උදා: අර්ථ සාධක අරමුදල් පනත
- සේවකයන් සම්බන්ධ අණපනත් උදා: වෘත්තීය සමිති ආඥා පනත
- ව්‍යාපාරය ආරම්භ කරන ප්‍රදේශයේ විශේෂ අවසර ලබාගැනීම උදා: නගර සභාව
- වෙනත් විශේෂ නෛතික අවශ්‍යතා උදා : මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත යුතු බලපත්‍ර

(ල. $4 \times \frac{1}{2}$ = 02)

ආ.

- ලාභ අලාභ බෙදා ගැනීම සම්බන්ධව
- හවුල් ව්‍යාපාරය අවසන් කරන විට ප්‍රාග්ධනය බෙදා ගැනීම සම්බන්ධව
- හවුල්කරුවන් පෞද්ගලික දරණ ලද වියදම් සම්බන්ධව
- ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සිදු කිරීම සම්න්ධව
- නව හවුල්කරුවෙකු බඳවා ගැනීම සම්බන්ධව
- හවුල් ව්‍යාපාරයේ ගිණුම්පොත් සම්බන්ධව
- හවුල් කරුවන්ගේ ගැනිලි සම්බන්ධව
- හවුල්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධව
- 

(ල. $4 \times \frac{1}{2}$ = 02)

iv. අ.

- රජයේ සහනාධාර බෙදා හැරීම
- ස්වාභාවික ව්‍යවසනයන්හිදි අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදා හැරීම
- ප්‍රාදේශීය නිෂ්පාදකයින්ගේ ඇතැම් භාණ්ඩ සඳහා වෙළඳපොළ පහසුකම් සැපයීම
- අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සහන මිලට ලබාගැනීම
- වෙළඳ පොලෙහි භාණ්ඩ හිග අවස්ථාවන්හි භාණ්ඩ බෙදා හැරීම

(ල. $2 \times \frac{1}{2}$ = 01)

ආ. **සමානකම්**

- ප්‍රධානියාගේ උපදෙස් පරිදි කටයුතු කිරීම
- ගිවිසුමක් මත දෙපාර්ශවය කටයුතු කිරීම
- සමාගමේ කීර්ති නාමය තම ව්‍යාපාරික කටයුතු සඳහා යොදා ගැනීම (ල. $2 \times \frac{1}{2}$ = 01)

**අසමානකම්**

| වරලත් | නියෝජිත |
|---|---|
| • භාණ්ඩ අයිතිය වරලත් ලාභියාට හිමිවේ | • භාණ්ඩ අයිතිය ප්‍රධානියාට හිමි වේ |
| • වරලත් හිමියාට පුරස්කාරයක් ගෙවීමට සිදුවේ | • ඇතැම්විට ඇපයක් තැබීමට සිදුවේ |
| • වරලත් ලාභියාට ලාභ හිමිවේ | • නියෝජිතයාට කොමිස් හිමිවේ |
| • ප්‍රවර්ධන කටයුතු වරලත් ලාභියා විසින් සිදු කරයි | • ප්‍රවර්ධන කටයුතු බොහෝ විට ප්‍රධානියා විසින් සිදු කරයි |

(ල. $2 \times \frac{1}{2}$ = 01)

v. අ. එක සමාන නොවන වෙනස් වර්ග වල ව්‍යාපාර සංයෝජනයවීම, විෂම සංයෝජනය වේ. උදා: විස්කම් නිෂ්පාදන සමාගමක් සපත්තු නිෂ්පාදන සමාගමක් සමග සංයෝජනය වීම.

(උදාහරණ සහිත පිළිතුරට ල. 02)

vi. ආ. **වාසි**

- කාර්යක්ෂමතාවය වර්ධනය
- නවෝත්පාදන වර්ධනය
- තරගකාරීත්වය වර්ධනය
- දේශපාලන මැදිහත්වීම අවම වීම
- රජ්‍ය අයවැය මත පීඩනය අවම වීම / රාජ්‍ය වියදම අඩුවීම (ල. $2 \times \frac{1}{2}$ = 01)

**අවාසි**

- මිල වැඩිවීම
- රජයේ පාලනයෙන් බැහැරවීම නිසා සම්පත් නාස්තිය වැඩිවීම
- රජයේ ආදායම් අඩුවීම තුළින් මහජනයාට ලැබෙන සේවා හා පහසුකම් අඩුවීම
- සුබසාධන භාණ්ඩ හා සේවා අඩුවීම (ල. $2 \times \frac{1}{2}$ = 01)

(3).

i. අ. ඔව්

මිනිස් අවශ්‍යතා හා උවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදන කිරීම , බෙදා හැරීම, හා ඊට අනුබද්ධ කටයුතු ව්‍යාපාර ලෙස හඳුන්වන අතර මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීම සඳහා අවදානම් කළමනාකරණය හා නව්‍යතා සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසාය වේ. ව්‍යාපාර අවදානම් කළමනාකරණය හා නව්‍යතා සම්පාදනයේ නොයෙදෙන ලෙස ව්‍යාපාර සියල්ල ව්‍යවසාය නොවේ. (ල. $1\frac{1}{2}$ )

ආ.

- පරිසර සංරක්ෂණය
- සෞඛ්‍යමය සේවා
- සාරධර්ම පෝෂණය
- සමාජීය වටිනාකම (ල. $4 \times \frac{1}{2}$ = 02)

ii. අ.

- ව්‍යාපාරික තීරණ ගැනීම
- ව්‍යාපාර සංවිධාන කටයුතු
- ව්‍යාපාර පාලන කටයුතු (ල. $2 \times 1$ = 02)

ආ.

| නිර්නායකයක | ආයතනය |
|---|---|
| • සේවක සංඛ්‍යාව 25ට අඩු ව්‍යාපාර | • ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව |
| • ස්ථිර සේවක සංඛ්‍යාව 25 ට අඩු ව්‍යාපාර | • ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය |
| • භාවිතාකරන විදුලිබල ධාරිතාව කැලරි කිලෝවෝට් ඇම්පියර් 50ට අඩු | • ශ්‍රී ලංකා මහා බැංකුව |
| • ආයෝජිත ප්‍රාග්ධනය රුː මිː 20 නොඉක්මවන ව්‍යාපාර | • කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය |
| • යොදවා ඇති ප්‍රාග්ධනය රුːමිː 4 නොඉක්මවූ ව්‍යාපාර | • කාර්මික සංවර්ධන මණ්ඩලය |
| • යොදවා ඇති ප්‍රාග්ධනය රුːමිː 4 නොඉක්මවූ ව්‍යාපාර | • කාර්මික තාක්‍ෂණ ආයතනය |
| • යොදවා ඇති ප්‍රාග්ධනය රුːමිː 4 නොඉක්මවූ ව්‍යාපාර | • කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව |

(ල. $4 \times \frac{1}{2} = 02$)

iii. අ.

- ප්‍රාග්ධනය සපයාගැනීමේදී මුහුණපාන දුෂ්කරතා / මූල්‍ය ගැටළු
- කළමනාකරණ දුර්වලතා
- වෙළඳපොළ තරගකාරීත්වයට මුහුණ දීමට ඇති අපහසුව
- ව්‍යවසායකත්ව හැකියා අඩුවීම
- යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
- අලෙවිකරණ ගැටලු බහුල වීම
- නව තාකක්‍ෂණය යොදා නොගැනීම
- රාජ්‍ය අනුග්‍රහය ප්‍රමාණවත් නොවීම

(ල. $4 \times \frac{1}{2} = 02$)

ආ.

- ව්‍යවසාය සංවර්ධන වැඩසටහන
- උපදේශන සේවා
- පර්යේෂණ හා තාක්‍ෂණික සේවා
- යටිතල පහසුකම් සැපයීම
- විශිෂ්ඨතා සම්මාන ලබාදීම

(ල. $4 \times \frac{1}{2} = 02$)

iv. අ.

- විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම
- වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම

(ල. $2 \times 1 = 02$)

ආ.

- ස්වයංක්‍රීය ටෙල්ලර් යන්ත්‍ර
- ස්වංක්‍රීය තැම්පතු යන්ත්‍ර
- චෙක්පත් තැම්පතු යන්ත්‍ර
- වෙළඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල
- ටෙලි බැංකු පහසුකම්
- අන්තර්ජාල බැංකු කටයුතු

(ල. $4 \times \frac{1}{2} = 02$)

v. අ.

- සාමාජික හා සාමාජික නොවන්නන්ගේ තැම්පතු ලබාගැනීම
- උගස් කටයුතු
- ඉතිරි කිරීමේ හා ස්ථාවර තැම්පත් ගිණුම් පවත්වාගෙන යාම
- සාමාජිකයන්ට නව පහසුකම් සැලසීම
- සමූපකාර ජීවන ක්‍රමය ගැමි ජනතාව අතර ප්‍රචලිත කිරීම

(ල. $4 \times \frac{1}{2} = 02$)

vi. ආ.

| බැංකු අයිරා | බැංකු ණය |
| --- | --- |
| • ලාභ ගැනීම සඳහා ජංගම ගිණුමක් අත්‍යාවශ්‍ය වේ | • ජංගම ගිණුමක් අවශ්‍ය නොවේ |
| • වාණිජ බැංකුවලින් පමණි | • වෙනත් මූල්‍ය ආයතන වලින් ද ලබාදේ |
| • කෙටිකාලීන ණය විශේෂයකි | • කෙටි හෝ දිගු කාලීන ණය විශේෂයකි |
| • පොළිය වැඩිය | • සාපේක්ෂව පොළිය අඩු ය |
| • ඉක්මනින් පියවිය යුතු ය | • සාපේක්ෂව ඉක්මණින් පියවිය යුතු නොවේ |
| • කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් බොහෝ විට ලාභගනී | • ඕනෑම අවශ්‍යතාවයක් වෙනුවෙන් ලබාදේ |
| • ස්ථාවර අයිරාවලට පමණක් ඇප සුරකුම් අවශ්‍ය කෙරේ | • ඇප සුරකුම් අවශ්‍ය කෙරේ |


(4).

i. අ. පළමු පක්ෂය - රක්ෂිතයා - ප්‍රසාදි
දෙවන පක්ෂය - රක්ෂකයා - MAX රක්ෂණ සමාගම (ල. $2 \times 1$ = 02)

ආ. රක්ෂ්‍ය හිමිකම (ල. 01)

ඉ. හානි පූර්ණ මූලධර්මය (මෝටර් රථයේ සත්‍ය වටිනාකමට වඩා අඩු වටිනාකමකට රක්ෂණය කර ඇති නිසා

ii.




කරුණු 06 ම නිවැරදිව උදාහරණ සහිතව නම් ලකුණු 04
කරුණු 05 ම නිවැරදිව උදාහරණ සහිතව නම් ලකුණු 05
කරුණු 04 ම නිවැරදිව උදාහරණ සහිතව නම් ලකුණු 02
කරුණු 03 ම නිවැරදිව උදාහරණ සහිතව නම් ලකුණු 01

iii. අ. මාර්ගය - අධිවේගී මාර්ගය
මාධ්‍ය - මෝටර් රථය (ල. $4 \times \frac{1}{2}$ = 02)

ආ.

1. සත්‍යයි
2. සත්‍යයි
3. අසත්‍යයි
4. අසත්‍යයි (ල. $4 \times \frac{1}{2}$ = 02)

iv. අ. කොමිස් නියෝජිතයා භාණ්ඩ මිලදී ගැනීම හා විකිණීම ප්‍රධානියාගේ නමින් සිදු කළත් සාධ්‍යකයා එම කාර්ය තම පෞද්ගලික නමින් සිදු කරයි. (ල. 02)

ආ.

- රටතුළ කර්මාන්ත දියුණු වීම
- රැකියා අවස්ථා උදාවීම
- රජයට බදු ආදායමක් ලැබීම
- විදේශ විනිමය ඉපයීම
- වෙළඳාම ප්‍රසාරණය වීම (ල. $4 \times \frac{1}{2}$ = 02)

v. අ.

- නැව් සමාගමේ නම
- නැවේ නම
- භාණ්ඩ වල විස්තර
- අපනයනකරුගේ නම
- ආනයනකරුගේ නම
- බඩු පටවන හා ගොඩබාන වරාය
- නැව් ගාස්තු
- නැව්පතිගේ අත්සන (ල. $4 \times \frac{1}{2}$ = 02)

vi. ආ. යම් ගෙවීමක් කිරීමේදී අදාළ භාණ්ඩය හෝ සේවාව ලබාගන්නා ආයතනයට ඍජුවම ගෙවීම නොකර පිළිගත් ගෙවීම් ආයතනයක් හරහා ගෙවීම් කිරීමේ ක්‍රමයයි (ල. 02)
උදා : www.paypal.com

(5).

i. අ. ගතික ව්‍යාපාර පරිසරය - විවිධ අවස්ථාවන්හි නිතර වෙනස්වීමවලට භාජනය වෙමින් පවතින අභ්‍යන්තර හා බාහිර පරිසරය
ඵලදායකත්වය - නියමිත කාලයක් තුළ ආයතනිකව නිමැවුම් හා යෙදවුම් අතර පවතින අනුපාතික සබඳතාව

ආ. 1. ඉහළ හා මධ්‍ය කළමනාකරුවන්ගේ සැලසුම් හා නියෝග ක්‍රියාත්මක කිරීම
2. කළමනාකරුවන් නොවන සේවකයන්ගේ කටයුතු අධික්ෂණ හා පාලනය කිරීම

ii.

අ කළමනාකරණ තීරණ, කළමනාකරණ සැලසුම් බලතල පැවරීම පිළිබඳ වැඩ බේදීම පිළිබඳව අංශ අතර සාමායෝජනය වූ ප්‍රශංසා හා අගය කිරීම

ආ 1. සංවිධානයේ සමස්තය දැකීමේ හැකියාව වර්ධනය කර ගැනීමට
2. ගැටලු තේරුම් ගැනීමට හා විසඳීමේ හැකියාව ලැබා ගැනීමට
3. දූරදර්ශී බව, තීක්ෂණව දැකීමේ හැකියාව ලබාගැනීමට
4. දිගුකාලීනව උපයමාර්ගික තීරණ ගැනීම
5. සංකීර්ණ අවස්ථා තුළ මතුවන නව අදහස් විශ්ලේෂණය කිරීමට

iii. අ **වගකීම** - කිසියම් කටයුත්තක් ඉටු කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ අවශ්‍යතාව (අධිකාරිය) බලතල සමඟ එම කටයුත්ත සාර්ථකව ඉටු කිරීමට කළමනාකරුවන් බැඳී සිටීමයි

**වගවීම** - වගකීම් ඉටු කිරීමට ඇති බැදියාව අධිකාරිය හා වගකීම් ලබාදී ඇති සේවකයා අණ කිරීමේ දාමයේ තමාට ඉහළින් සිටින පුද්ගලයාට තම කටයුතු පිළිබඳව වාර්තා කිරීම හා සාධාරණීය කළ යුතු වීම.

ආ. **ආයතන ප්‍රධානියා ලෙස** - උදා - සිසුන්ගේ සහතික පත්‍ර අත්සන් කිරීම, ත්‍යාග ප්‍රදානෝත්සවයකදී අමුත්තන් පිළිගැනීම
**සම්පත් වෙන්කර දෙන්නා** - උදා- විවිධ ශ්‍රේණි සඳහා ගුණාත්මක යෙදවුම් වෙන්කර දීම, පාසලේ විවිධ අංශ/ ශ්‍රේණි සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම

iv. අ.

- සේවක ඵලදායිත්වය ඉහළ නංවාගත හැකිවීම
- නිෂ්පාදන ධාරිතාව ඉහළ නංවාගත හැකි වීම
- තෘප්තිමත් සේවක පිරිසක් බිහිවීම
- සේවක ප්‍රවාසිතාවය අවම වීම
- සේවක පිරිවැටුම් අවම වීම

ආ. **අණ කිරීමේ දාමය** - සංවිධානයේ ඉහළ කළමනාකරණයේ සිට පහළ කළමනාකරණය තෙක් නොකැඩුනු අධිකාරී මාර්ගය
**අණ කිරීමේ ඒකීයතාවය** - එක් සේවකයකු එක් සුපරීක්ෂකවරයෙකුට පමණක් වගකිව යුතුය යන මූලධර්මය

v. අ

එකතු කළ අගය - පරිවර්තන ක්‍රියාවලියේ විවිධ අවස්ථාවලදී යෙදවුම්වලට වටිනාකමක් එකතු වීමෙන් නිෂ්පාදිතයේ වටිනාකම වැඩිවීම

උදා - ඇඟලුම් නිෂ්පාදනයේදී රෙදි කැපීම මැසීම මැදීම ඇසිරීම යන අවස්ථා පසුකර ඇඟලුම් බවට පත්කළ පසු එහි අගය යෙදවීම්ල අගයට වඩා වටිනාකමක් ගනු ලබයි

ආ. එකඟ නොවේ

පවත්නා නිෂ්පාදිතය පිළිබඳවත් නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳවත් ඇතුළත් පැහැදිළි කිරීමට

(6).

i. අ.

- නිෂ්පාදිතයේ ස්වභාවය
- වෙළඳපල ප්‍රමාණය
- යොදාගන්නා තාක්‍ෂණය හා අවශ්‍ය උපකරණ
- දැරිය යුතු පිරිවැය
- මිලදී ගැනීමේ රටාව
- සම්පත් ලබා ගැනීමේ පහසුව

ආ. ආරම්භයේ සිට අවසානය තෙක්ම එක් අයිතමයක් නිෂ්පාදනය කෙරෙන අතර ගනුදෙනුකරුවන්ගේ නිෂ්චිත ඇණවුමක් මත වර්තමාන ඉල්ලුම පදනම් කර නිෂ්පාදනය සිදු කිරීම

උදා - මනාලියකට මංගල ඇඳුම් මැසීම
උපන් දිනයක් සඳහා කේක් එකක් නිර්මාණය කිරීම

ii. අ. බාහිර ප්‍රතිකාර ඒකක එක් ස්ථානකද රසායනාගාර පහසුකම් තවත් ස්තානයක ද එක්ස් - රේ ස්කෑන් යනාදි පහසුකම් තවත් ස්ථානයකද ශෛලාගාර පහසුකම් තවත් ස්ථානයකද ඇක්ෂි ප්‍රතිකාර තවත් ස්ථානයකද යනාදි වශයෙන් එක් එක් ක්‍රියාවලිය සඳහා වෙන වෙනම ස්ථාන අවශ්‍ය යන්ත්‍ර උපකරණ සහ පුහුණු ශ්‍රමය වෙනම ස්ථාන ගත කර තිබීම ආරෝග්‍ය ශාලාවට පැමිණෙන රෝගීන්ගේ ස්වභාවය අනුව එක් එක් අංශ කරා යොමු කරයි මේසේ පැහැදිලි කර තිබීම

iii. අ. A - ආරක්ෂිත තොගය B - අවම තොගය
C - යළි ඇණවුම් ප්‍රමාණය D - උපරිම තොග මට්ටම

ආ. ඒකකයක දායකය = ඒකක විකුණුම් මිල - ඒකක විචල්‍ය පිරිවැය
= රුː 220 - 190
= රුː 30

සමච්ජේදන ඒකක සංඛ්‍යාව = $\frac{\text{මුළු ස්ථාවර පිරිවැය}}{\text{ඒකකයක දායකත්වය}}$

$= \frac{90\ 000}{220-190}$

$= \frac{90\ 000}{30}$

= ඒකක 3 000

iv. අ. අඩු පිරිවැයක් යටතේ නිෂ්පාදිතයන්ට කැමති භාණ්ඩ වෙළෙඳපොළෙහි සුලභ කිරීම මගින් සිය නිෂ්පාදන සාර්ථකව අලෙවිකර ගැනීමට හැකියාව තිබීම නිෂ්පාදිත සංකල්පය වන බැවින් එහිදී පාර්බෝගික අවශ්‍යතා පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීම නිසාය

තම ඉලක්ක වෙළඳපොලේ අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඊට අනුකූලව භාණ්ඩ හා සේවා නිර්මාණය කළ යුතු බවත්, ඒ මගින් පාරිභෝගික තෘප්තිය ළඟා කර දිය යුතු බවත්, අලෙවිකරණය සංකල්පයෙන් අදහස් කරන බැවිත්

ආ. මෙය සේවා සපයන ව්‍යාපාරයක් නිසා සේවා අලෙවිකරණ මිනුමේ විචල්‍යයන් හතම කෙරෙහි ඔහු අවදානය යොමු කළ යුතු ය. එනම්,
නිෂ්පාදිතය මිල, ස්ථානය, ප්‍රාග්ධනය, මිනිසුන්, ක්‍රියාවලිය හා භෞතික වටපිටාව ඇතුළත්ව කරුණු ඉදිරිපත් කිරීම

v. අ. අදහස්, ඉසව්/සිද්ධි, පුද්ගලයෝ, අත්දැකීම්, ස්ථාන, සංවිධාන, දේපළ හා තොරතුරු

ආ. මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා ඉටුකරලීම
මිලක් තිබීම
හිමිකරුවන් සිටීම

(7).

i. අ.

- හර ප්‍රතිලාභ - නිෂ්පාදිතයකින් ලබාදෙන ප්‍රධානතම ප්‍රයෝජනය යි
මෝටර් රථයක් මිලට ගන්නා ප්‍රවාහනය සඳහා

- මූලික නිෂ්පාදිතය - හර ප්‍රතිලාභ මූලික නිෂ්පාදියන් බවට පත් වේ
මෝටර් රථ එංජිම, කඳ, ආසනවලින් සමන්විතව ඉදිරිපත් කිරීම

- අපේක්ෂිත නිෂ්පාදිතය - ගැනවුම්කරු අපේක්ෂා කරන අංග ලක්ෂණ සහිතව නිෂ්පාදිතය ඉදිපත් කිරීමයි
මෝටර් රථයේ වේගය ආරක්ෂාව සුව පහසුව

- වැඩි දියුණු කළ නිෂ්පාදිතය - ගනුදෙනුකරු අපේක්ෂා කරන මට්ටමටත් වඩා ඉහළ මට්ටමක් සහිතව නිෂ්පාදිතය වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම
මෝටර් රථය වායු සමීකරණය ,TV , Power Mirror ආදිය

- විභව නිෂ්පාදිතය - ගනුදෙනුකරුට අනාගතයේදී අවශ්‍ය විය හැකි යැයි සිතා නිෂ්පාදන සැලසුම් කිරීමේදී අගයන් එකතු කිරීම මඟින් විභව වෙළඳ පොළට පිවිසීමයි
මෝටර් රථය නුදුරු අනාගතයේදී පරිගනක වැඩසටහන් මඟින් ධාවනය වන ආකාරයට නිපදවීම වැනි නව අදහස් වලට ලකුණු ලබා දෙන්න

ii. අ.

- භාණ්ඩයේ ස්වභාවය
- වෙළඳපොලේ ස්වභාවය
- ඉල්ලුම් ස්වභාවය
- තරගකරුවන්ගේ බෙදාහැරීමේ මාර්ග
- නිෂ්පාදකයාගේ ශක්තිය

ආ. ප්‍රාථමික ඇසුරුම - භාණ්ඩයක ප්‍රථම ඇසුරුම නිදසුන් ලෙස කිරිපිටි බහා ඇති පොලිතීන් ඇසුරුම
ද්විතියික ඇසුරුම් - ප්‍රාථමික ඇසුරුමකට පිටතින් ඇති වෙනත් ඇසුරුමක් නිදසුන් ලෙස කිරිපිටි ඇතුළත් පොලිතීන් ඇසුරුම බහා ඇති කාඩ්බෝඩ් ඇසුරුම
ප්‍රවාහන ඇසුරුම - ප්‍රාථමික හා ද්විතීයික ඇසුරුම් සහිත නිෂ්පාදිත තොගයක් ප්‍රවාහනය කිරීමේදී භාවිත කරන විශාල බහාලුම් නිදසුන් ලෙස කිරිපිටි ඇතුළත් කාඩ්බෝඩ පෙට්ටි 24ක් බහාලූ විශාල පෙට්ටියක්

iii. අ.

- ඵලදායි මාර්ගවලගින් අරමුදල් ලබා ගැනීම
- ඵලදායී මාර්ගවලින් මුදල් ආයෝජනය
- මුදල් ඉපයීම
- ප්‍රති ආයෝජනය
- මුදල් නිදහස් කිරීම

ආ. මුදල් අයවැය ලේඛනයක් ව්‍යාපාරයක අනාගතයේ අපේක්ෂිත ලැබීම් හා ගෙවීම් පෙන්නුම් කරන පුරෝකථනයක් වන අතර සත්‍ය වශයෙන්ම සිදු වූ නැතිනම් අතීත මුදල් ලැබීම් හා ගෙවීම් ඇතුළත් වාර්තාවක් මුදල් පොතක් වේ.

iv. අ.

- ආයෝජනයේ ප්‍රතිලාභ
- ආයෝජනයේ අවදානම
- ද්‍රව්‍යශීලතාව
- පරිසර සාධක
- අවිනිෂ්චිත බව
- ආයතනයේ ප්‍රතිපත්ති
- ආයෝජනයේ පිරිවැය
- නීතිමය තත්ත්වය
- මෙහෙයුම් ක්‍රියාකාරීත්වයට ඇති බලපෑම

ආ. **රජයේ සුරකුම්පත්වල ආයෝජනය කිරීමේ වාසි -**

- ඉහළ හා ස්ථාවර පොලියක් හිමිවීම
- රජයේ ආරක්ෂාව ලැබීම
- ආයෝජන අවස්ථාවේදී ම ප්‍රතිලාභ හිමිවීම
- ආයෝජනයේ අවධානම ඉතා අඩුමට්ටමක පැවතීම
- ඉහළ ද්‍රවශීලතාවයක් පැවතීම
- කල්පිරීමට පෙර වට්ටම් කර ගත හැකිවීම
- බදු සහන හිමිවීම
- සුරැකුම්පත් ඇප සුරැකුම්පත් ලෙස භාවිත කළ හැකිවීම

v. වරණීය කොටස් / ණයකර නිකුත් කිරීම වඩා යෝග්‍ය වේ

- අවතෝලන ප්‍රාග්ධන ව්‍යුහයක් පවතින බැවින් ණය ප්‍රාග්ධනය තුළින් අරමුදල් ලබාගැනීම යෝග්‍ය වේ. එවිට ව්‍යාපාරයේ හිමිකමට සිදුවන බලපෑම අඩු වේ.
- සමාගමේ ලාභදායත්වය ද ඉහළ මට්ටමක පවතින නිසා සාමාන්‍ය කොටස් නිකුත් කිරීමට වඩා වරණීය කොටස් / ණයකර නිකුත් කිරීම වාසිදායක වේ. ලාභදායකත්වය වැඩි වුනත් නිශ්චිත පොලියක් හෝ නිශ්චිත ලාභාංශයක් ගෙවීමට සිදුවන නිසා මෙවැනි කරුණු පිළිතුරට ලකුණු දෙන්න.

8.

i. අ. ඔව්

සජීවි සම්පත් වීම , සිතීමට හා ප්‍රතික්‍රියා දැක්වීමට හැකි වීම , සෙසු සම්පත් පාලනය කළ හැකි වීම , පුහුණු කිරීමෙන් අගය වැඩි වීම, කණ්ඩායම් වශයෙන් කටයුතු කළ හැකි වීම , චර්යා සංකීර්ණ වීම හා පුරෝකථනය කළ නොහැකිවීම , නිර්මාණාත්මක හැකියා සහිත වීම

ආ.

| රැකියා විස්තරය | රැකියා පිරිවිතරම |
|---|---|
| • රැකියා විස්තර කරයි | • රැකියාවේ නියුක්තවීමට පුද්ගලයා විස්තර කරයි. |
| • රැකියාවකට අයත් කටයුතු රාජකාරි හා වගකීම් විස්තර කරයි | • කිසියම් රැකියාවක් සඵලදායිව හා කාර්යක්ෂමව ඉටු කිරීමට පුද්ගලයාට |
| • රැකියාවේ ගති ලක්ෂණ පිළිබඳ ලේඛනයකි | • රැකියාව සාර්ථකව ඉටු කිරීමට තිබිය යුතු මානව ගති ලක්ෂණ ලේඛනයකි |
| • රැකියා විස්තරයේ කොටසක් ලෙස රැකියා පිරිවිතරය අඩංගු වේ | • රැකියා පිරිවිතරයේ කොටසක් ලෙස රැකියා විස්තරය අඩංගු නොවේ. |

ii. අ. අයදුම්පත් ඇගයීම , සම්මුඛ පරීක්ෂණ , බුද්ධි පරීක්ෂණ , පෞරුෂ පරීක්ෂණ , ප්‍රායෝගික පරීක්ෂණ , වෛද්‍ය පරීක්ෂණ , පසුබිම් පරීක්ෂණ

ආ. **පෙර සුදානම :**

අවශ්‍ය ලිපි ලේඛණ සපයා ගැනීම , ඇඳුම් පැළඳුම් සුදානම , ස්ථානය , මාර්ගය පිළිබඳ දැනුවත් වීම ආදිය

**සම්මුඛ පරීක්ෂණයේ දී :**

ආචාර කිරීම , පරීක්ෂක මණ්ඩලයේ ඇරයුමට අනුව අසුන් ගැනීම හොඳ අවධානයෙන් යුතුව කටයුතු කිරීම., අවශ්‍ය ලියකියවිලි පිළිවෙලට ක්‍රමානුකූලව පිළිවෙලට ඉදිරිපත් කිරීම ආදි කරුණු (වෙන් කිරීම අවශ්‍ය නැත)

iii. අ. සරසිට වාචිකව හා ලිඛිතව අවවාද කිරීම , පරිවාස කාලය දීර්ඝ කිරීම , සරසිව වෙනත් අංශයකට මාරු කිරීම , සරසිගේ සේවය අවසන් කිරීම

ආ. **ප්‍රාදේශීය ක්ෂේත්‍රවල ජාල LAN**

එකම කාමරයක හෝ එකම ගොඩනැගිල්ලක හෝ එකම වැඩබිමක පිහිටා තිබෙන පරිගණක හා වැඩපොළවල් අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ කොට සකස් කරන ජාලය

**පුළුල් ක්ෂේත්‍රජාල WAN**

රටවල් කිහිපයක හෝ නගර කිහිපයක තිබෙන පරිගණක සම්බන්ධ කර ගොඩනගා ගත් පරිගණක ජාලයකි.

iv. අ. විස්තරාත්මක බව , නම්‍යශීලි බව , ලබාගැනීමේ පහසුව , සංසන්දනය කළ හැකි බව , අවබෝධ කර ගත හැකි බව, විශ්වාසදායක බව , නිවැරදි බව , කාලීන බව, පිරිමැසුම් බව , පූර්ණ බව , අදාළ බව

ආ. ව්‍යාපාරයක තීරණ ගැනීම හා පාලනය සඳහා අවශ්‍ය වන තොරතුරු රැස් කිරීම , සැකසීම , ගබඩා කිරීම හා බෙදා හැරීම සඳහා වු අන්තර් සම්බන්ධතාවකින් යුත් උපාංග සමූහයක එකතුවක් තොරතුරු පද්ධතියක් වේ.

ආරක්ෂිත ක්‍රම , Pass Word , Antivirus , Backup , Fire walls , ප්‍රතිපත්ති හා උපදෙස් සැකසීම ආදි

v. අ. සමස්ත ලෝකයම එකම වෙළෙඳසැලක් බවට පත් කිරීමට අන්තර්ජාලයට හැකි වී තිබීම , අවකාශ වෙළෙඳ පොළ , ප්‍රචාරණ කටයුතු ව්‍යාප්ත වීම , පිරිවැය අඩුවීම , ඍජු වෙළදාම , විශාල වෙළෙඳපොළ අවස්ථා උදාවීම , යාවත් කාලීන කරන ලද තොරතුරු ලබාගත හැකි වීම ආදි කරුණු

ආ. එකඟ නොවේ

පවත්නා ව්‍යාපාරයක් පුළුල් කිරීමේදී , ව්‍යාපාර ඒකාබද්ධ කිරීමේදී , ව්‍යාපාරයක් නවීකරණ කිරීමේදී හා ව්‍යාපාරයක් මිලදී ගැනීමේදී ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කරයි.